# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2061/11 - 2018 මාර්තු මස 05 වැනි සඳුදා - 2018.03.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වැනි වගන්තිය යටතේ නියමය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය. රංජිත් සියඹලාපිටිය වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.


2018 මාර්තු මස 05 වැනි දින.

**උපලේඛනය**

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ, මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කයේ, මන්නාරාම කෝරළයේ, මන්නාරම-බටහිර පත්තුවේ, මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තොඩ්ඩවේලි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තොඩ්ඩවේලි ග්‍රාමයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකසන ලද අංක CEB/MWPP/ACQLOT4/01 අංක දරන 2018.01.26 දිනැති දළ සැළැස්ම මගින් දක්වෙන පහත සඳහන් මායිම් සහිත, ඛණ්ඩාංක A($9^0$1'32.33''N $79^0$51'56.76''E), B($9^0$1'30.16''N $79^0$51'59.6''E), C($9^0$1'25.26''N $79^0$51'56.26''E), D($9^0$1'27.92''N $79^0$51'53.29''E) මගින් මායිම් වූ, ප්‍රමාණයෙන් හෙක්ටයාර 2.0398ක් වූ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ෆෝ ටීස් රෙස්ට් ඉන් පවතින ඉඩම |
| *නැගෙනහිරට* | : | තොඩ්ඩවේලි - තාල්පාඩු මාර්ගය |
| *දකුණට* | : | මන්දුකුඩියිරුප්පු මාර්ගය |
| *බටහිරට* | : | මෙම ඉඩමේම ඉතිරි කොටස |

| | | |
|---|---|---|
| *හිමිකම් කියන අය* | : | අයිතිකරු නොදනී |




03- 780

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.